# හාවුන් ඇති කිරීම



දියුණු වන රටවල් වල මස් සඳහා හාවුන් ඇති කිරීම වැදගත් ස්ථානයක් ගෙන ඇත. මෙයට හේතු වන්නේ :

(අ) ඔවුන් සඳහා සපයන ආහාර සඳහා තරඟයක් නොතිබීම.

(ආ) අඩු වියදමකින් හා අඩු කාලයකින් මස් ලබා ගැනීමට හැකි වීම.

(ඇ) ඔවුන් සඳහා දරන්නට ඇති මූලික වියදම වන කූඩු සඳහා යන වියදම් අඩුවීම යන ඒවාය.

හාවුන් ඉතා සීඝ්‍රයෙන් බෝ වන සතුන් වර්ගයකි හාවුන්ට සාපේක්ෂ වශයෙන් කෙටි ගැබ් කාලයක් තිබීමත්, මුළුබර්රට අනුපාතිකව දිනපතා බර එකතු වීම වැඩි වීමත්, කෙටි කාලයක දී අභිජනනයට සුදුසු වීමත් යන කරුණු මත හාවුන් ඉක්මණින් බෝ කර ගත හැකිය. එක ගැහැණු සතෙකුට වර්ෂයක් තුල පැටවුන් 32 ක් පමණ බිහි කළ හැක.

ශ්‍රී ලංකාවේ හාවුන් ඇති කිරීම එතරම් ජනප්‍රිය නොවුවත් ගවමස් එළු මස් ඌරු මස් හා සන්සන්දනය කරන විට පෝෂ්‍ය ගුණය අතින් හා මස් ඉතා සතුටුදයක බව පෙනේ. මෙය පහත දැක්වෙන සටහනින් පැහැදිලි වේ.

| | මාංශ ජනක ධාතු (%) | මේද (%) | ලවණ (%) |
|---|---|---|---|
| හා මස් | 20,5 | 4 | 1.5 |
| ගව මස් | 18.5 | 18 | 0.9 |
| එළු මස් | 17.0 | 25 | 1.0 |
| ඌරු මස් | 16.0 | 27 | 1.0 |

හා මස් වල වැඩි මාංශ ජනක ධාතු හා ලවන ප්‍රමාණයක්ද, අඩු මේද ප්‍රමාණයක් ද ඇති නිසා මිනිස් පෝෂණ යට හිතකර බව පැහැදිලිය.

### හාවුන් වර්ග

ශ්‍රී ලංකාවේ ඇති කිරිමට යෝග්‍ය වන්නේ මධ්‍යම තරමේ සුදුපැහැති කෙටි ලෝම ඇති හාවුන් ය. ඒ සඳහා සුදුසු වන්නේ නවසීලන්ත සුදු හාවුන් වර්ගය හා කැලිපෝර්නියා හාවන් ය. තවත් ජනප්‍රිය වී ඇති හාවුන් වර්ග නම් :

1. හිමාලයා වර්ගය
2. යෝද ෆ්ලෙමිෂ් වර්ගය
3. බෙවරෙන්
4. චින්චිලා
5. ඩච්
6. ප්‍රංශ ලොප්
7. රෙක්ස්

### හාවුන් සඳහා කූඩු සෑදීම

සාමාන්‍යයෙන් හාවුන්ට තරමක් සිසිල් ස්ථාන වඩා යෝග්‍ය වේ. උෂණත්වයේ වැඩිවීම ප්‍රජනනය කෙරෙහි බලපාන බැවින් කූඩු තැනීමේ දී මෙය සැලකිල්ලට ගත යුතු කරුණකි. එමනිසා කූඩු ගංගා හා පොකුණු ආශ්‍රිත ප්‍රදේශවල හෝ මඩු තුල හෝ සෙවන ඇති ස්ථානයන්හි තිබිය යුතු ය.

කූඩු තැනීමේ දී පුවක්, උණ බටයුලි වර්ග හෝ කම්බි භාවිතා කළ හැක. හාවුන් සඳහා කූඩු තැනීම අඩු වියදමකින් කර ගත හැක.

පිරිමි හාවුන් තනි තනියට ඇති කල යුතුය. ගැහැණු සතුන් ඒඳහා තනි කූඩු අවශ්‍ය වන්නේ පැටවු ඇති කිරීම සඳහාය.

### හාවුන් බෝකිරීම

බෝ කිරීම සඳහා තෝරා ගන්නා හාවුන් මධ්‍යම ප්‍රමාණයෙන් සිටිය යුතු අතර හොඳට වැඩුනු පුෂ්ටි මත් සතුන් විය යුතුය. එම සතාගේ දෙමව්පියන් ගේ ලක්ෂණ (පරම්පරාවෙන් රැගෙන එන) හොඳ විය යුතුය.

මීට අමතරව සලකා බැලිය යුතු කරුණු නම් ඉතා හීලෑ බව, එක මුරයකට වැඩි පැටවුන් සංඛ්‍යාවක් ලැබීම, කිරෙන් වැරීමෙ දී වැඩි බරක් තිබීම, පැටවුන් හොඳහැටි රැක බලා ගැනීමේ හැකියාව හා පැටවුන් උත්පත්තියේ දී මරණ සංඛ්‍යාව අඩු වීමයි.

මස් සඳහා ඇති කරන ක්ෂීරපායී සතුන් අතරින් වඩාත්ම අධික ප්‍රජනන වේගයක් තිබෙන්නේ හාවාටය හාවුන් ඇති කිරීම දියුණු කළ හැකි එකම මග ඔවුන් බෝ කිරීමේ ක්‍රමයයි. මෙහිදී සැලකිල්ලට ගතයුතු කරුණක් වන්නේ ලඟ නෑදෑකම් ඇති හාවුන් අතර මුහුන් කිරීම (පට්ටි දැමීම) වැලක්වීමය. මේ අයුරින් ලැබෙන පැටවුන් ඉතා හොඳ ලක්ෂණ පෙන්නුම් නොකරති. එමනිසා එක් පරම්පරාවකින් තෝරා ගන්නා ගැහැණු හාවුන් පට්ටි දැමීම සඳහා උන්ට නෑකම් නැති පිරිමි හාවුන් තෝරා ගත යුතුය.

තවද මස් සඳහා ශීඝ්‍රයෙන් වැඩෙන පැටවුන් ලබා ගැනීම සඳහා එකිනෙකට වෙනස් හා වර්ග දෙකක් පට්ටි දැමිය යුතුය.

උදා : යෝද ප්ලේමිෂ් (පිරිමි)—නවසීලන්ත සුදු

(ගැහැනු)—ශීඝ්‍රයෙන් වැඩෙන දෙමුහුන් පැටවු එහෙත් මේ දෙමුහුන් පැටවු බෝ කිරීම සඳහා පාවිච්චි නොකරන්න.

**ආහාර**

හාවුන්ට ආහාර සඳහා වන වියදම ඉතාමත් අඩු වන අතර මිනිසුන්ගේ ආහාර සමග තරඟ නොකරයි සාමාන්‍යයෙන් හාවුන්ගේ ආහාර සඳහා යෝග්‍ය වන්නේ තණ කොළ, උඳුපියලිය, ඉපිල් ඉපිල්කොළ බතල කැරට් එරබදු, පලා වර්ග හා පුන්නක්කු යනාදියයි සෑම විටම ලවණ මිශ්‍රණයක් දීම ඉතා වැදගත් ය.

සාමාන්‍යයෙන් තණකොළ (නොමේරූ මල් පිපීමට පෙර) දිනකට කි. 1–1½ ක් සැපයිය යුතුය. නිතර පිරිසිදු ජලය බීමට තිබිය යුතුය. ගැහැණු සාවකු සහ පැටවුන් සඳහා දිනකට ජලය ගැලුම් 1–2ක් පමණ අවශ්‍ය වේ. ජලය තැබීම සඳහා ටින්, බෝතල් හෝ ඇතිලි පාවිච්චි කිරීමට පුළුවන.

**පාලනය**

සාමාන්‍යයෙන් ගැහැණු සාවුන් මාස 5–6 ක් පමණ වයසට පැමිණි විට පට්ටි දැමීමට සුදුසු කාලය වේ. එවිට සාමාන්‍යයෙන් බර කි. 3 ක් පමණ වේ. අනිකුත් සතුන් මෙන් ගැහැණු සාවුන් පට්ටි ලකුණු නොපෙන්වයි. ගැහැණු සාවුන් 10 දෙනෙක් සඳහා එක පිරිමි හාවෙකු සෑහේ. දැමීම සඳහා ගැහැණු හාවා සහ පිරිමි හාවා එක් කූඩුවක එක් දිනක් තබා ඉන් ඉන්පසු ව වෙන් කළ යුතුය.

හාවුන්ගේ ගැබ් කාලය දින 30 ක් පමණ වේ. ප්‍රසූතියට දින කීපයකට පෙර ගැහැණු හාවා ඇගේ ලෝම ගලවනු දැකිය හැකිය. එවිට ඇයට උණුසුම් පිරිසිදු පහසු ස්ථානයක් පැටවුන් දැමීම සඳහා සැපයුව හොත් වඩාත් මැනවි. පැටවු දැමූ විගසම මැරී ඇති, දුර්වල හෝ විකෘති වූ පැටවුන් වහාම ඉවත් කළ යුතුය. ප්‍රසූතියෙන් පසු මවට ලා තණකොල හා පුන්නක්කු ස්වල්පයක් සැපයිය යුතුයි. මවගෙන් පැටවා වෙන් කරන්නේ දින තිස්අටක් ගත වූ විටය. දින 10 ක් වයස් වූ විට පැටවුන් ඇස් ඇරී ප්‍රසූතියෙන් දින 2 ක් හෝ 3 කට පසුව නැවතත් පට්ටි දැමීමට පුළුවන . එසේ නැතහොත් පැටවුන් මවගෙන් වෙන් කල වහාම පට්ටි දැමිය යුතුය.

**මස් සඳහා විකිණීම**

සාමාන්‍යයෙන් හාවකු කි. 2 ක් පමණ බරට පැමිණි විට මස් සඳහා සුදුසු වේ. ලංකාවේ මෙම බර ලබා ගැනීමට මාස 4 හෝ 5 ක් පමණ ගත වේ.

**රෝග**

ගබ්සාව සහ පැටව් උපතේ දි මැරී සිටීම—

මෙය රෝග නිසා හෝ ගැබ්බර හාවා කලබල කිරීමෙන් හෝ සිදු විය හැකිය.

**පැටවුන් මිය යාම**

පළමු සතිය තුල පැටවුන් මිය යන්නේ පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් විය යුතුය. අධික සීතල දුර්වල පැටවු ඇති බව, පැටවු කිරි නොබීම, මවට කිරි නොමැති කම, වැඩි පැටවු ගණනක් ඇතිකම, තන ඉදිමීම.

**කොක්සිඩියෝසිස්**

කොක්සිඩියෝසිස් රෝග ලක්ෂණ එකට රොක්වී සිටීම, හම ගොරෝසු වීම හා සමහර විට බඩයෑම් වේ.

**අනෙක් රෝග**

බඩ යෑම, සෙම්ප්‍රතිශ්‍යාව හා නියුමෝනියාව යන රෝග වලට හාවන් ඉතා පහසුවෙන් ගොදුරු වේ. හාවන් අසනීප වූ විට වහාම පශු වෛද්‍ය උපදෙස් ලබා ගත යුතුය. අසනීප වූ හාවෙකු පශු වෛද්‍ය නිලධාරියාට පෙන්වා ප්‍රතිකාර ලබා දිය යුතුය.

# කල්තබා ගත හැකි ගව ආහාරයක්

වියලි කාලවල ලබාගත හැකි තණකොල ප්‍රමාණය අඩු බැවින් ඔබගේ එළදෙනට ආහාර සැපයීම අපහසු විය හැක. එහෙත් වර්ෂා කාලයේ ප්‍රමාණයටත් වඩා තෘණ අස්වැන්න වැඩිවන බව ඔබ දන්නා කරුණකි. මෙම වර්ෂා කාලයේ නිපදවෙන අමතර තෘණ අස්වැන්න, තෘණ කල් තබාගන්නා ක්‍රමයක් වන සයිලේජ්, බවට හරවා ඒවා වියලි කාලයේදී ප්‍රයෝජනයට ගත හැක. එවිට වියලි කාලයේදී තෘණ හිඟයක් ඇතිවීම ඔබට ප්‍රශ්නයක් නොවනු ඇත.

**සයිලේජ් සෑදීම**

සයිලේජ් යනු—අළුතින් කපාගත් තෘණ වැයුරෝදක තත්ව යටතේ ගබඩා කර තැබූ විට ලැබෙන අවසාන ඵලය වේ. සයිලේජ් සාද ගන්නා ස්ථානය "සයිලෝව" නම් වේ.

**යොදගත හැකි ද්‍රව්‍ය**

* තණකොළ—ඕනෑම වර්ගයක්
* ධාන්‍ය—සෝගම්, තිරිඟු
* රණිල—ග්ලිරිසීඩියා, ඉපිල් ඉපිල්, (තණකොළ සමඟ 50%ක් මිශ්‍ර කරගත හැක.)
* අමතර ද්‍රව්‍ය—උක්ගස් කරටි, බතල වැල්, ඉවත ලන පළතුරු හා එලවළු කොටස්.

තත්වයෙන් උසස් සයිලේජ් සෑදීමට නම් :—

* භාවිතා කරන තෘණ, මල් පිපීමට පෙර කපා ගන්න.
* භාවිතා කරන තෘණවල 65%70%ක පමණ සාමාන්‍ය තෙත් ගතියක් තිබිය යුතුය. තෙත් ගතිය වැඩිනම් වියලන්න. වියලීම වැඩිනම් ජලය ටිකක් ඉසින්න. නියම තත්වයට වියලී ඇත්නම් තෘණ මිටක් ගෙන මිරිකීමෙන් පසු සෙමෙන් දිග ඇරෙනු ඇත.

පළමුව දිග තෘණ හෝ අනෙක් කොටස් අඟල් 9 පමණ කැබලි වලට කපාගන්න. කපාගත තෘණ සයිලේජ් වලට දමන්න. තෘණ තට්ටුවක් දමා හොඳින් තද කර ඉන් පසු තවත් තෘණ තට්ටුවක් දමා හොඳින් නැවත තද කරන්න. තෘණ තට්ටු අතරට ධාන්‍ය ස්වල්පයක් දැමීමෙන් පෝෂ්‍ය ගුණය වැඩි සයිලේජ් සාද ගත හැක. තෘණ තද කිරීම ට්‍රැක්ටර් මගින් හෝ මිනිසුන් යොදවා හෝ කරගත හැක. තද කිරීමෙන් බලාපොරොත්තු වන්නේ වාතය ඉවත් කිරීමයි.

හොඳින් තදකර වල මුදුන් වන සේ පිරවීමෙන් පසු පොලිතීන් එකකින් පිරුණු වල වසා, ඒ මත තුනී පස් තට්ටුවක් අතුරන්න. දින තුනකින් පමණ මට්ටම පහල බසී නම් නැවත පස් තට්ටුවක් යොදන්න. සයිලෝව පිරවීමේදී දින එකක් හෝ දෙකක් ඇතුලත පුරවා අවසන් කරගත යුතුය.

**සහනාධාර**

සයිලේජ් සෑදීමට දිරි ගැන්වීමක් වශයෙන් සවත් නිෂ්පාදක හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව රු. 1,800 ක සහනාධාර මුදලක් ගව හිමියන්ට ලබාදේ. මෙම මුදල වාරික තුනකින් ගෙවනු ලැබේ.

පලමු වාරිකය රු. 800 යි.

දිග අඩි 12 පළල අඩි 6 උස අඩි 4 ප්‍රමාණයේ වළක් සකස්කල පසු පලමු වන වාරික මුදල ලබා ගත හැක.

දෙවැනි වාරිකය රු. 500 යි.

සකස්කල වලට ජලය කාන්දු වීම වැලැක්වීමට ගඩොල් බිත්ති බැඳීමෙන් පසු මෙම වාරිකය ලබා ගැනුමට පුළුවන.

තුන්වැනි වාරිකය රු. 500 යි.

වල තෘණ වලින් පුරවා අවසන් වූ පසු මෙම වාරිකය ලබාගැනීමට පුළුවන.